# (25) ඉතිහාසය

මෙම විෂයය I පත්‍රය සහ II පත්‍රය වශයෙන් ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

I පත්‍රය - 25 ශ්‍රී ලංකා ඉතිහාසය

II පත්‍රය - 25 A ඉන්දීය ඉතිහාසය
25 B යුරෝපා ඉතිහාසය
25 C නූතන ලෝක ඉතිහාසය

මෙහි දී ඉතිහාසය විෂයය තෝරා ගන්නා සියලු ම අයදුම්කරුවන් (25) ශ්‍රී ලංකා ඉතිහාසය සඳහා අනිවාර්යයෙන් ම පෙනී සිටිය යුතු අතර, (25 A) ඉන්දීය ඉතිහාසය හෝ (25 B) යුරෝපා ඉතිහාසය හෝ (25 C) නූතන ලෝක ඉතිහාසය හෝ යන ප්‍රශ්න පත්‍ර තුනෙන් එකකට පමණක් පෙනී සිටිය යුතු ය.

**(25) ශ්‍රී ලංකා ඉතිහාසය/ (25 A) ඉන්දීය ඉතිහාසය/ (25 B) යුරෝපා ඉතිහාසය/ (25 C) නූතන ලෝක ඉතිහාසය**

**කාලය පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10යි.)
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත වේ.

I කොටස - වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **40**කි. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් මුළු ලකුණු **40**කි.

II කොටස - මෙය A, B හා C වශයෙන් කොටස් තුනකින් සමන්විත වේ.
**A කොටස** - අනිවාර්ය ප්‍රශ්නයකින් සමන්විත වේ. ලකුණු **12** කි.

B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක්වත් තෝරාගෙන ප්‍රශ්න **තුනකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 16 බැගින් ප්‍රශ්න තුනට ලකුණු 48කි.

**B කොටස** - මෙම කොටස රචනා හා අර්ධ ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **හතරකින්** සමන්විත වේ.

**C කොටස** - මෙම කොටස රචනා හා අර්ධ ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න **හතරකින්** සමන්විත වේ.

I හා II පත්‍ර සඳහා මුළු ලකුණු :

| | | |
|---|---|---|
| I කොටස | = | 40 |
| II කොටස | = | 60 |
| ලකුණු | = | 100 |

අවසාන ලකුණ ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය (25) | = | 100 |
| II පත්‍රය (25 A / 25 B / 25 C) | = | 100 |
| අවසාන ලකුණ | = | 200 ÷ 2 = 100 |

# (25) ශ්‍රී ලංකා ඉතිහාසය

**(ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා)**

**I පත්‍රය (I කොටස)**

**සැලකිය යුතුයි.**

* **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

* **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

---

- අංක **01** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග **නොගැළපේ**. එම **නොගැළපෙන** නම කුමක් දැයි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) පාහියංගල (2) බෙලිලෙන (3) බටදොඹලෙන (4) දොරවක (5) බූන්දල (.......)

**2.** (1) මහාතිත්ථ (2) ඌරාතොට (3) ජම්බුකෝලපට්ටන (4) සම්මන්තුරෙයි (5) ගෝකණ්ණ (.......)

**3.** (1) දීපවංසය (2) මහාවංසය (3) රසුවංසය (4) බෝධිවංසය (5) ථූපවංසය (.......)

**4.** (1) සූරතිස්ස (2) ලඤ්ජිතිස්ස (3) මහාචූලී මහාතිස්ස (4) කුපික්කල මහාතිස්ස (5) කුටකණ්ණ තිස්ස (.......)

**5.** (1) විහාරමහා දේවි (2) රත්නාවලී (3) කල්‍යාණවතී (4) සුනේත්‍රා දේවි (5) සමුද්‍ර දේවි (.......)

**6.** (1) උපෝසථඝර (2) චේතියඝර (3) ප්‍රතිමාඝර (4) බෝධිඝර (5) සූතිඝර (.......)

**7.** (1) කොන්ස්තන්තීනු ද බ්‍රැගන්සා
(2) පේද්‍රෝ ලෝපේස් ද සූසා
(3) ජෙරනිමෝ ද අසවේදු
(4) කොන්ස්තන්තීනු ද සා ද නොරොඤ්ඤා
(5) දියෝගු ද මේලෝ ද කැස්ත්‍රෝ (.......)

**8.** (1) බූටැවේ රටේරාල
(2) හඟුරන්කෙත ඩිංගිරාල
(3) ගොඩගෙදර මොහොට්ටාල
(4) කිවුලෙගෙදර මොහොට්ටාල
(5) කොහුකුඹුරේ රටේරාල (.......)

**9.** (1) හෙන්රි මන්ක් මේසන් මුවර් (2) සෝල්බරි සාමි (3) ජෝන් කොතලාවල (4) ඔලිවර් ගුණතිලක (5) විලියම් ගොපල්ලව (.......)

**10.** (1) ගල්ඔය ව්‍යාපාරය (2) මින්නේරිය ව්‍යාපාරය (3) නාච්චදූව ව්‍යාපාරය (4) ඉරණමඩු ව්‍යාපාරය (5) පරාක්‍රම සමුද්‍රය ව්‍යාපාරය (.......)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක් දැයි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.** (1) දැදුරු ඔය - මාගල්ල වැව
(2) මල්වතු ඔය - නාච්චදූව වැව
(3) මහවැලි ගඟ - මින්නේරිය වැව
(4) යාන් ඔය - හුරුළු වැව
(5) කලා ඔය - කලා වැව (.......)

**12.** (1) විජය - තම්බපණ්ණි
(2) පණ්ඩුවාසුදේව - ඌරාතොට
(3) භද්දකච්චානා - ගෝකණ්ණ
(4) සංඝමිත්තා තෙරණිය - ජම්බුකෝලපට්ටන
(5) හේමමාලා සහ දන්ත කුමරු - ලංකාපටුන (.......)

**13.** (1) සූරතිස්ස - එළාර
(2) පළමුවන සේන - ශ්‍රී මාර ශ්‍රී වල්ලභ
(3) හතරවන උදය - පළමුවන පරන්තක
(4) පස්වන මහින්ද - පළමුවන රාජරාජ
(5) පරාක්‍රම පණ්ඩු - කාලිංග මාඝ (.......)

**14.** (1) පොන්නම්බලම් අරුණාචලම් - ලංකා ජාතික සංගමය
(2) එන්.එම්. පෙරේරා - ලංකා සම සමාජ පක්ෂය
(3) ඩී.එස්. සේනානායක - එක්සත් ජාතික පක්ෂය
(4) ජී.ජී. පොන්නම්බලම් - පෙඩරල් පක්ෂය
(5) එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරණායක - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (.......)

**15.** (1) 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණය - ව්‍යවස්ථාදායක සහ විධායක සභා පිහිටුවීම
(2) 1910 කෲව්-මැකලම් ප්‍රතිසංස්කරණය - සීමිත ඡන්ද බලය හඳුන්වා දීම
(3) 1920 මැනිං ප්‍රතිසංස්කරණය - පළාත් බද නියෝජනය හඳුන්වා දීම
(4) 1947 සෝල්බරී ප්‍රතිසංස්කරණය - විධායක කාරකසභා ක්‍රමය හඳුන්වා දීම
(5) 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - නාමික විධායකයක් හඳුන්වා දීම (.......)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ ප්‍රකාශන/ දින වකවානු සමූහයක් **X** හා **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම/ ප්‍රකාශන/ දින වකවානු, **X** තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ**. **Y** තීරුව, **X** තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**16.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ථූපාරාමය | A | මහාසේන |
| (ii) | රුවන්වැලිසෑය | B | පළමුවන පරාක්‍රමබාහු |
| (iii) | අභයගිරිය | C | දුටුගැමුණු |
| (iv) | ජේතවනාරාමය | D | දේවානම්පිය තිස්ස |
| (v) | යුදගනා වෙහෙර | E | වළගම්බා |

(1) D C E A B (2) D C A E B (3) D A B C E (4) E A C B D (5) E C A D B (.......)

**17.** X — Y

(i) වසභ — A මානවම්ම පෙළපත
(ii) ධාතුසේන — B නායක්කර් පෙළපත
(iii) පළමුවන සේන — C කාලිංග පෙළපත
(iv) නිශ්ශංකමල්ල — D මෝරිය පෙළපත
(v) ශ්‍රී විජය රාජසිංහ — E ලම්බකණ්ණ පෙළපත

(1) D A E B C (2) B A C E B (3) E C A B D (4) E D C A B (5) E D A C B (.......)

**18.** X — Y

(i) තෝනිගල සෙල්ලිපිය — A අධිකරණ කාර්යය පිළිබඳ නීතිරීති
(ii) මිහින්තලේ පුවරු ලිපිය — B වෙළෙඳ නගරයක පාලනය පිළිබඳ නීතිරීති
(iii) වේවැල්කැටිය සෙල්ලිපිය — C වෙළෙඳ ශ්‍රේණියක ධාන්‍ය නැත්පත් කිරීමේ නීතිරීති
(iv) බදුල්ල ටැම් ලිපිය — D පාලකයන් දෙදෙනකු විසින් එළැඹි ගිවිසුමක්
(v) සංගමු විහාර සෙල්ලිපිය — E විහාරාරාමයක දේපළ පාලනය පිළිබඳ නීතිරීති

(1) B A E C D (2) C E A B D (3) C E A D B (4) D A E B C (5) E C D B A (.......)

**19.** X — Y

(i) කණ්ඨකචේතිය — A පොළොන්නරුව
(ii) කොටවෙහෙර — B රත්නපුර
(iii) තිවංක පිළිමගෙය — C ගෝකණ්ණ
(iv) තිරුකෝණේශ්වරම් — D දැදිගම
(v) මහ සමන් දේවාලය — E මිහින්තලේ

(1) A D C E B (2) D E B A C (3) E A C B D (4) E B A C D (5) E D A C B (.......)

**20.** X — Y

(i) ජුආඕ රිබෙයිරෝ — A ලංකා දිවයිනේ ඓතිහාසික විස්තරය (An Historical Relation of the Island of Ceylon)
(ii) ෆර්නාවෝ ද ක්වේරොස් — B ලංකාව: දිවයින පිළිබඳ විස්තරයක් (Ceylon : An Account of the Island)
(iii) රොබට් නොක්ස් — C ලංකාද්වීපයේ ඓතිහාසික ඛේදවාචකය (Historical Tragedy of the Island of Ceilao)
(iv) එමර්සන් ටෙනන්ට් — D ලංකාවේ පනස් වසක් (Fifty Years in Ceylon)
(v) තෝමස් ස්කිනර් — E ලංකාධිපත්‍යය (Temporal and Spiritual Conquest of Ceylon)

(1) B E A C D (2) C E A B D (3) C A E D B (4) D A E B D (5) E B C D A (.......)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21.** **පොළොන්නරුවේ චෝළ පාලනය**

(1) පොළොන්නරුව ජනනාථමංගලම් ලෙස නම් කරන ලදී.
(2) ශ්‍රී ලංකාවේ උතුරු කොටස මුම්මුඩි ශෝල මණ්ඩලම් ලෙස හැඳින්විණි.
(3) වාණවණ්මාදේවී ඊශ්වරම් නම් ශිව දේවාලය වර්තමානයේ දී අංක 02 දරණ ශිව දේවාලය නමින් හැඳින්වේ.
(4) වෙල්ගම් වෙහෙර රාජරාජපෙරුම්පල්ලි යනුවෙන් නම් කරන ලදී.
(5) දෙමළ මහසෑය නම් ස්තූපයක් චෝළ පාලකයන් විසින් කරවන ලදී. (.......)

**22.** යාපනය රාජධානිය

(1) යාල්පාණවෛපවමාලෛ යාපනය රාජධානිය පිළිබඳ ව අධ්‍යයනය කිරීමට ඇති ප්‍රධාන මූලාශ්‍රයකි.

(2) විජය කුලංගෛයි චක්‍රවර්ති යාපනය රාජධානියේ ප්‍රථම පාලකයා විය.

(3) නල්ලූර් යාපනය රාජධානියේ අගනුවර විය.

(4) මැදවල සෙල්ලිපියට අනුව ගම්පොළ රජවරු යාපනය රාජධානියෙන් කප්පම් ලබා ගත්හ.

(5) 1619 දී පෘතුගීසීන් විසින් යාපනය රාජධානිය යටත් කරගන්නා ලදී. (.......)

**23.** ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ

(1) දෙවන විමලධර්මසූරිය රජතුමාගේ පුත්‍රයා විය.

(2) ''සෙල්ලම් නිරිඳු'' නමින් හැඳින්විණි.

(3) රාමඤ්ඤ දේශයෙන් උපසම්පදාව රැගෙන ආවේ ය.

(4) කුණ්ඩසාලේ රාජ මාළිගයක් තැනවී ය.

(5) අවසාන සිංහල රජතුමා විය. (.......)

**24.** කෝපි වගාවේ ව්‍යාප්තිය

(1) ලන්දේසීහු කෝපි වගාව ව්‍යාප්ත කිරීමට උත්සාහ ගත්හ.

(2) ජෝර්ජ් බර්ඩ් මහා පරිමාණයේ පළමුවන කෝපි වත්ත ගම්පොළ ආරම්භ කළේය.

(3) බ්‍රිතාන්‍ය ආණ්ඩුව කෝපි වගාවට අනුග්‍රහය ලබා දුන්නේය.

(4) කෝපි වතුවල වැඩ කිරීම සඳහා දකුණු ඉන්දියානු කම්කරුවන් ගෙන එන ලදී.

(5) විසිවන සියවස ආරම්භයේ දී ද කෝපි යටත් විජිත ආණ්ඩුවේ ප්‍රධානම ආදායම් මාර්ගය විය. (.......)

**25.** ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය

(1) ලංකා විශ්වවිද්‍යාලය 1942 දී පිහිටුවන ලදී.

(2) ආරම්භයේ සිට ම විශ්වවිද්‍යාල අධ්‍යාපනය ස්වභාෂා මාධ්‍යයෙන් පවත්වාගෙන යනු ලැබීය.

(3) 1945 දී නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය විශ්වවිද්‍යාල අධ්‍යාපනයට හඳුන්වා දෙන ලදී.

(4) 1959 දී විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් විශ්වවිද්‍යාල බවට පත් කරන ලදී.

(5) 1974 දී යාපන විශ්වවිද්‍යාල මණ්ඩපය ස්ථාපිත කෙරිණි. (.......)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A), (B), (C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ....................................... **1** ද,

**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ....................................... **2** ද,

**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ....................................... **3** ද,

**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ....................................... **4** ද,

ප්‍රතිචාර **එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ** නිවැරදි නම් ............... **5** ද වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක්** නිවැරදි ය. |

**26.** එළාර රාජ්‍ය සමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) මහාවංසයට අනුව එළාර රජතුමා සාධාරණ හා ධාර්මික පාලකයෙකු ලෙස සලකනු ලැබේ.

(B) එළාර රජතුමා වසර හතළිස් හතරක් රජරට පාලනය කළේය.

(C) එළාර රජතුමා චෛතියගිරියෙහි ස්තූපයක් කරවීය.

(D) හල්ලුක, එළාර රජුගේ සේනාධිපතියෙකු විය. (.......)

**27.** අනුරාධපුර යුගයේ විදේශ වෙළෙඳාම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) මහාතිත්ථ ප්‍රධාන වෙළෙඳ වරායක් විය.
(B) ශ්‍රී ලංකාව කපු පිළි නිර්යාත කළේය.
(C) ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දියාව අතර සමීප වෙළෙඳ සබඳතා පැවතුණි.
(D) වෙළෙඳ ප්‍රජාව චෙට්ටියාර්වරුන් නමින් හැඳින්විණි. (.......)

**28.** කෝට්ටේ රාජධානිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) පන්සිය පනස් ජාතක කථා පොත කෝට්ටේ යුගයේ දී රචනා කරන ලදී.
(B) හයවන පරාක්‍රමබාහු රජතුමා කෝට්ටේ රජකළ ශ්‍රේෂ්ඨතම පාලකයා විය.
(C) 1521 විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජධානිය දේශපාලන බලප්‍රදේශ තුනකට බෙදුණි.
(D) හත්වන භුවනෙකබාහු රජතුමා කෝට්ටේ රාජධානිය පෘතුගීසීන්ට පවරා දුන්නේය. (.......)

**29.** උඩරට රාජධානියේ පරිපාලන ක්‍රමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) උඩරට රාජධානියේ පරිපාලන ක්‍රමය රජු වටා කේන්ද්‍රගතව පැවතුණි.
(B) මරණීය දණ්ඩනය පැනවීමේ බලය පැවතියේ රජුට පමණි.
(C) අදිකාරම්වරු ප්‍රධාන පරිපාලන නිලධාරීන් වූහ.
(D) සමස්ත රාජධානියම දිසාවනි හා රට නම් පරිපාලන ඒකකවලට බෙදා පැවතුණි. (.......)

**30.** ලන්දේසීන් යටතේ පැවති අධිකරණ ක්‍රමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ලන්දේසීන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණය පිහිටුවන ලදී.
(B) ලන්දේසීහු නඩු ඇසීම සඳහා ජූරිසභා ක්‍රමය උපයෝගී කර ගත්හ.
(C) ලන්දේසීහු රෝම-ලන්දේසී නීතිය ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්හ.
(D) ලන්දේසීන් විසින් දෙමළ ජනතාවගේ නීතිරීති හා චාරිත්‍රවාරිත්‍ර ''තේසවලමෙයි'' නමින් සංග්‍රහ කරන ලදී. (.......)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**31.** ශ්‍රී ලංකාවේ සිතියමක් නිර්මාණය කළ මුල් ම යුරෝපීය ජාතිකයා කවුද?
(1) ඇරිස්ටෝටල් (2) මෙගස්තිනීස් (3) ටොලමි (4) ප්ලිනි (5) ස්ට්‍රාබෝ (.......)

**32.** සිත්තරුබිම් බුදල්නාවන් ගැන සඳහන්වන අභිලේඛනය කුමක් ද?
(1) වල්ලිපුරම් රන්පත
(2) පනාකඩුව තඹ සන්නස
(3) අඹගමුව සෙල්ලිපිය
(4) දෙවනගල සෙල්ලිපිය
(5) කුට්ටාපිටිය තඹ සන්නස (.......)

**33.** මුල්ලේරියා සටනේ දී පෘතුගීසීන්ට එරෙහි ව සටන් වැදුනේ කවරෙක් ද?
(1) ටිකිරි බණ්ඩාර
(2) වීදිය බණ්ඩාර
(3) නිකපිටියේ බණ්ඩාර
(4) එදිරිල්ලේ රාළ
(5) මහා අස්ථාන (.......)

**34.** උඩරට රාජධානි සමයේ දී ප්‍රවාහන කාර්යාංශය හඳුන්වන ලද්දේ කිනම් නමකින් ද?
(1) කොට්ටල් බද්ද (2) කුරුවේ බද්ද (3) මහ බද්ද (4) කින්නර බද්ද (5) මඩිගේ බද්ද (.......)

**35.** කොළඹ ජාතික කෞතුකාගාරය පිහිටුවන ලද්දේ කුමන ආණ්ඩුකාරවරයාගේ පාලන සමයේ දී ද?
(1) හෙන්රි වෝඩ්
(2) චාල්ස් මැකාර්ති
(3) හර්කියුලීස් රොබින්සන්
(4) විලියම් ග්‍රෙගරි
(5) ආතර් ගෝර්ඩන් (.......)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** හා **5** යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමු වැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර, පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | ඉබ්බන්කටුව මෙගලිතික (මහ ශිලා) සුසාන භූමියකි. | චීන සංචාරක භික්ෂුවක් වූ ෆාහියන් ක්‍රි.ව. 411 දී ශ්‍රී ලංකාවට පැමිණ දෙවසරක් අභයගිරි විහාරයේ වැඩවාසය කළේ ය. | (.......) |
| **37.** | ගිරිතලේ වැව මහාසේන රජතුමා විසින් කරවන ලදැයි පැවසේ. | ඇතැම් උගතුන්ට අනුව සඳකඩ පහන සංසාර චක්‍රය සංකේතවත් කරයි. | (.......) |
| **38.** | කෝට්ටේ රාජධානියේ ප්‍රධාන රාජකීය ආදායම් මාර්ගය වූයේ වෙළෙඳාම නොව ඉඩම්වලින් ලැබූ ආදායමයි. | කෝට්ටේ රජු රටේ විශාලතම ඉඩම් හිමියා වූ අතර, ඔහු රාජකීය ඉඩම්වලින් ලත් වාර්ෂික ආදායම පනම් මිලියන තුන ඉක්මවා ගියේ ය. | (.......) |
| **39.** | පෘතුගීසීහු ශ්‍රී ලංකාව තුළ රෝමානු කතෝලික ආගම ප්‍රචාරය කළහ. | පෘතුගීසිහු ශ්‍රී ලංකාවට මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දුන්හ. | (.......) |
| **40.** | ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් 1796 දී බ්‍රිතාන්‍ය කිරීටයේ විජිතයක් බවට පත්විය. | ශ්‍රී ලංකාව 1948 දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබා ගත්තේ ය. | (.......) |

* *

# (25) ශ්‍රී ලංකා ඉතිහාසය

**(ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා)**

I පත්‍රය (II කොටස)

සැලකිය යුතුයි.

* **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **එක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **තුනකට ද** පිළිතුරු සපයන්න.

(පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක්** සපයා ඇත.)

---

**A කොටස**

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | | |
|---|---|---|---|
| **(i)** ජජ්ජර නදී | **(ii)** කප්පකන්දර නදී | **(iii)** පොම්පරිප්පු | **(iv)** ලංකාපටුන |
| **(v)** සිතුල්පව්ව | **(vi)** යෝධ වැව | **(vii)** පොළොන්නරුව | **(viii)** නල්ලූර් |
| **(ix)** කෝට්ටේ | **(x)** මහනුවර | **(xi)** උතුරු මැද පළාත | **(xii)** සේනානායක සමුද්‍රය |

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)

**B කොටස**

**2.** මහාසේන රාජ්‍ය සමයේ අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමෙහිලා මූලාශ්‍රයක් ලෙස **මහාවංසයේ** ඇති වැදගත්කම පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.

**(i)** කර්තෘත්වය හා රචිත කාලය (ලකුණු 02යි)

**(ii)** අඛණ්ඩ හා කාලනීර්ණයානුකූල ඉතිහාසයක් ඉදිරිපත් කිරීම (ලකුණු 07යි)

**(iii)** අභිලේඛන මූලාශ්‍රයවලින් තොරතුරු තහවුරු වීම (ලකුණු 07යි)

**3.** ශ්‍රී ලංකා ඉතිහාසයෙහි වළගම්බා රජතුමාගේ දේශපාලන හා සංස්කෘතික කාර්යසිද්ධිය විවේචනාත්මක ව විමසන්න. (ලකුණු 16යි)

**4.** ''වාරිකර්මාන්තය රජරට ශිෂ්ටාචාරයේ ප්‍රධාන අංගයකි.''

**(i)** පණ්ඩුකාභය රජතුමා විසින් කරවන ලද වැවක් නම් කරන්න. (ලකුණු 01යි)

**(ii)** මින්නේරිය හා ගිරිතලේ යන වැව් ඉදිකරවන ලද රජවරුන් නම් කරන්න. (ලකුණු 02යි)

**(iii)** වැවක ප්‍රධාන අංග හා ඒවායින් ඉටු වූ කාර්යය සැකෙවින් දක්වන්න. (ලකුණු 04යි)

**(iv)** වාරිකර්මාන්තය රජරට ශිෂ්ටාචාරයේ ප්‍රධාන අංගයක් වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 09යි)

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

**(i)** සීගිරිය

**(ii)** දෙවන පරාක්‍රමබාහු රජතුමා

**(iii)** යාපනය රාජධානිය

**(iv)** කෝට්ටේ යුගයේ අධ්‍යාපනය හා සාහිත්‍යය (එක් කෙටි සටහනකට ලකුණු 08 බැගිනි)

## C කොටස

**6.** දහනවවන සියවසේ ශ්‍රී ලංකාවේ ඇති වූ ජාතික හා සංස්කෘතික පුනර්ජීවනය පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ විග්‍රහ කරන්න.

**(i)** බෞද්ධ පුනර්ජීවනය

**(ii)** හින්දු පුනර්ජීවනය

**(iii)** ඉස්ලාම් පුනර්ජීවනය (ලකුණු 16යි)

**7.** ''ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාසනයේ සන්ධිස්ථානයක් සලකුණු කරයි.''

**(i)** ඩොනමෝර් කොමිසම පැමිණෙන විට ශ්‍රී ලංකාවේ සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා නම් කරන්න. (ලකුණු 01යි)

**(ii)** ඩොනමෝර් කොමිසමේ සාමාජිකයන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02යි)

**(iii)** ඩොනමෝර් කොමිසම පත් කිරීමට තුඩු දුන් සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 05යි)

**(iv)** ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාසනයේ සන්ධිස්ථානයක් සලකුණු කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

**8.** නිදහසෙන් පසු ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික සංවර්ධනය පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.

**(i)** ගොවි ජනපද ව්‍යාපාරය

**(ii)** ජනසතු ව්‍යාපාරය

**(iii)** ආනයන ආදේශන ප්‍රතිපත්තිය (ලකුණු 16යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

**(i)** ශ්‍රී ලංකාවේ පෘතුගීසි බල ව්‍යාප්තිය

**(ii)** කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා සහ ලන්දේසීන් අතර සම්බන්ධතා

**(iii)** 1848 බ්‍රිතාන්‍ය විරෝධී සටන

**(iv)** සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතාගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

(එක් කෙටි සටහනකට ලකුණු 08 බැගින්)


* * *

# (25) ශ්‍රී ලංකා ඉතිහාසය

**(ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා)**

**II කොටස**

1.



# (25 A) ඉන්දීය ඉතිහාසය

**(ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා)**

**II පත්‍රය (I කොටස)**

සැලකිය යුතුයි.

* **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
* **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

---

- අංක **01** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග **නොගැළපේ**. එම **නොගැළපෙන** නම කුමක් දැයි හඳුනාගෙන එහි **අංකය** වරහන **තුළ** ලියන්න.

**1.** (1) ජම්බුද්වීප (2) ඉන්ඩිකා (3) ඉන්දෝස් (4) සින්දෝස් (5) භාරත වර්ෂ (.......)

**2.** (1) කෝසල (2) පංචාල (3) මගධ (4) අවන්ති (5) වෙංගි (.......)

**3.** (1) තප්ති (2) ජේලම් (3) චේනාබ් (4) රාවි (5) බියස් (.......)

**4.** (1) ආරවල්ලි (2) සුලෙයිමාන් (3) කිර්තාර් (4) නිල්ගිරි (5) හින්දුකුෂ් (.......)

**5.** (1) රජගහ (2) ශ්‍රවණ බෙල්ගෝලා (3) කුසිනාරා
(4) වෛශාලී (5) කපිලවස්තු (.......)

**6.** (1) ෙදාලවීරා (2) කලිබන්ගන් (3) රානාඝුණ්ඩායි
(4) අජ්මීර් (5) චන්හුදාරෝ (.......)

**7.** (1) සීලප්පදිකාරම් (2) මණිමේකලෛ (3) තිරුක්කුරල්
(4) ශාකුන්තල (5) කම්බරාමායනම් (.......)

**8.** (1) තාරානාථ (2) ෆාහියන් (3) හියුංසාං (4) ඉට්සිං (5) සුංයුං (.......)

**9.** (1) කණ්ණඩ (2) මලයාලම් (3) තෙළිඟු (4) උර්දු (5) තුළු (.......)

**10.** (1) නන්දිවර්මන් (2) කීර්තිවර්මන් (3) මහේන්ද්‍රවර්මන්
(4) නරසිංහවර්මන් (5) පරමේශ්වරවර්මන් (.......)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක් දැයි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.** (1) වාග්පති - ගෞඩවාහෝ
(2) පතංජලී - මහාභාෂ්‍ය
(3) බිල්හණ - රාජතරංගිනී
(4) හර්ෂවර්ධන - රත්නාවලී
(5) මහේන්ද්‍රවර්මන් - මත්තවිලාශ ප්‍රහසන (.......)

**12.** (1) යශෝවර්මන් - කනෞජ්
(2) පුලකේශීන් - වාතාපි
(3) ප්‍රභාකරවර්ධන - ථානේශ්වර
(4) වරගුණවර්මන් - මධුරෙයි
(5) පළමුවන වික්‍රමාදිත්‍ය - කල්‍යාණි (.......)

13. (1) සිසුනාග - කාලාශෝක
(2) කුෂාණ - හුවිෂ්ක
(3) සාතවාහන - සිමුඛ
(4) නන්ද - මහාපද්ම නන්ද
(5) ශුංග - කුජුල කැඩ්පයිසීස් (.......)

14. (1) තිරුවාලංගාඩු - මහේන්ද්‍රවර්මන්
(2) අලහබාද් - සමුද්‍රගුප්ත
(3) හාතිගුම්පා - ඛාරවේල
(4) රුමින්දෙයි - අශෝක
(5) ජුනාගාඩ් - රුද්‍රදාමන් (.......)

15. (1) හෙරඩෝටස් - ග්‍රීක
(2) චාණක්‍ය - චීන
(3) අල්බිරූනි - අරාබි
(4) කොස්මස් - බයිසන්තියන්
(5) ස්ට්‍රාබෝ - රෝම (.......)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ ප්‍රකාශන/ දින වකවානු සමූහයක් **X** හා **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම/ ප්‍රකාශන/ දින වකවානු, **X** තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ**. **Y** තීරුව, **X** තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.

16.

| X | Y |
|---|---|
| (i) නර්මදා | A තංජෝර් |
| (ii) සින්දු | B භාරුකච්ඡ |
| (iii) ගංගා | C විජයනගර් |
| (iv) තුංග භද්‍රා | D කනෞජ් |
| (v) කාවේරි | E තක්ෂිලා |

(1) A E C D A (2) B E D C A (3) C E B A D (4) D A E C B (5) E B D A C (.......)

17.

| X | Y |
|---|---|
| (i) නාගර්ජුනකොණ්ඩ | A ස්තූප |
| (ii) සාංචි | B පල්ලවරථ |
| (iii) අජන්තා | C කැටයම් |
| (iv) මථුරා | D බුදු පිළිම |
| (v) මහබලිපුරම් | E බෞද්ධ චිත්‍ර |

(1) A C E B D (2) B A E D B (3) C A E D B (4) C E A B D (5) E C B A D (.......)

18.

| X | Y |
|---|---|
| (i) බිම්බිසාර | A දේවපාල |
| (ii) චන්ද්‍රගුප්ත මෞර්ය | B දෙවන චන්ද්‍රගුප්ත |
| (iii) සමුද්‍රගුප්ත | C බිංදුසාර |
| (iv) ධර්මපාල | D විඩූඩභ |
| (v) පසේනදී කෝසල | E අජාසත්ත |

(1) A C B D E (2) D E B A C (3) D E A B D (4) E C D A B (5) E C B A D (.......)

**19.** X — Y

(i) නාගර්ජුන — A කථාසරිත්සාගරය
(ii) සෝමදේව — B කිරාතාර්ජුන
(iii) ජයදේව — C විභාෂාශාස්ත්‍ර
(iv) භවභූති — D මහාවීර චරිත
(v) භාරවි — E ගීත ගෝවින්ද

(1) A D E C B (2) B A D E C (3) C A E D B (4) D B E A C (5) D E A B D (.......)

**20.** X — Y

(i) ඛජුරාහෝ දේවාලය — A චාලුක්‍ය
(ii) කාංචියේ කෛලාසනාථ දේවාලය — B පල්ලව
(iii) බදාමි දේවාලය — C චෝළ
(iv) ශ්‍රී රංගම් දේවාලය — D චන්දෙල්ල
(v) තංජෝර් මහා දේවාලය — E පාණ්ඩ්‍ය

(1) B D A C E (2) C B D A E (3) D A E C B (4) D B A E C (5) E D A B C (.......)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21.** **ඍග් වෛදික යුගයේ සමාජය**

(1) පීතෘ මූලික සමාජයකි.
(2) ගෝත්‍රයෙහි නායකයා රාජන් නමින් හැඳින්විණි.
(3) කාන්තාවන්ට ආගමික කටයුතුවලට සහභාගී වීම තහනම් විය.
(4) ස්වභාවික සංසිද්ධි දේවත්වයෙහි ලා සැලකිණ.
(5) ආගමික කටයුතු සඳහා සෝම පානය ප්‍රයෝජනයට ගන්නා ලදී. (.......)

**22.** **ප්‍රථම පාණ්ඩ්‍ය අධිරාජ්‍යය**

(1) ක්‍රි.ව. 670 සිට ක්‍රි.ව. 920 දක්වා යුගයට අයත් වේ.
(2) මෙකල අගනගරය මධුරෙයි විය.
(3) මෙම අධිරාජ්‍යයේ ශ්‍රේෂ්ඨත ම පාලකයා වූයේ ශ්‍රී මාර ශ්‍රී වල්ලභ ය.
(4) ජටාවර්මන් සුන්දර පාණ්ඩ්‍ය නව ගෘහනිර්මාණ ශිල්පයක් හඳුන්වා දෙන ලදී.
(5) පළමුවන සේන රජු සමයේ දී පාණ්ඩ්‍යයෝ ශ්‍රී ලංකාව ආක්‍රමණය කළහ. (.......)

**23.** **ඉන්දු-ග්‍රීකයෝ**

(1) ඉන්දීය මූලාශ්‍රවල ඉන්දු-ග්‍රීකයෝ යවනයන් ලෙස හඳුන්වා ඇත.
(2) ඔවුන්ගේ අගනගරය සාගල නුවර විය.
(3) මිනැන්ඩර් බෞද්ධ පාලකයකු ලෙස සැලකේ.
(4) මිලින්ද පඤ්හ මේ සමයේ දී රචිත ග්‍රන්ථයක් ලෙස සැලකේ.
(5) මගධය දක්වා බලය පැතිරවීමට සමත් වූහ. (.......)

**24.** **ශුංග රාජවංශය**

(1) ක්‍රි.පූ. දෙවන සියවසේ ඉන්දියාව පාලනය කළ රාජවංශයකි.
(2) ශුංග වංශයෙන් පසුව බලයට පත්වූයේ මෞර්‍ය වංශය යි.
(3) ශුංග බලය පිරිහීම වසුමිත්‍රගෙන් ඇරඹිණි.
(4) පුෂ්‍යමිත්‍ර මෙම රාජවංශයේ ආරම්භකයා ලෙස සැලකේ.
(5) මෙම වංශයේ අවසන් පාලකයා වූයේ දේවභූති ය. (.......)

**25.** ඉන්දියාවට එල්ල වූ අරාබි හා තුර්කි ආක්‍රමණ

(1) පළමු අරාබි ආක්‍රමණය ක්‍රි.ව. 637 දී බොම්බායේ තානාවලට එල්ල විය.

(2) ක්‍රි.ව. 712 ආක්‍රමණයේ දී කාබුල් හා සින්ඩ් අල්ලා ගැනීම ඔවුන්ගේ අරමුණ විය.

(3) ධනය කොල්ලකෑම මෙම ආක්‍රමණවල එක් අරමුණක් විය.

(4) පළමු ආක්‍රමණයෙන් ම දිල්ලි සුල්තාන් අධිරාජ්‍යය පිහිටු වීමට සමත් විය.

(5) ක්‍රි.ව. 1025 දී සෝමනාත් දේවාලය විනාශ කිරීම සිදු විය. (.......)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A), (B), (C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන්, **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,

**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,

**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,

**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,

ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ................ **5** ද වරහන් තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට වැඩි** සංඛ්‍යාවක් නිවැරදි ය. |

**26.** පසේනදී කොසොල් රජු

(A) පසේනදි කොසොල් රජු දැඩි ජෛන භක්තිකයෙකු විය.

(B) ඔහුගේ සොහොයුරිය බිම්බිසාර රජු සමග විවාහ විය.

(C) ඔහුගේ රාජධානියෙහි අගනුවර ශ්‍රාවස්ති විය

(D) මෙම රජු ඝාතනය කොට අජාසත් රජවිය. (.......)

**27.** ගන්ධාර කලාව

(A) ගන්ධාර කලාවේ උච්චත ම අවධිය ගුප්ත යුගය යි.

(B) ගන්ධාරය කුෂාණයන් යටතේ වර්ධනය වූ කලා මධ්‍යස්ථානයකි.

(C) ගන්ධාර ප්‍රතිමාවල ග්‍රීක-රෝම ආභාසය දැකිය හැකි ය.

(D) ගන්ධාර ප්‍රතිමා අතර කිසිදු ගිහි ප්‍රතිමාවක් දක්නට නැත. (.......)

**28.** ගුප්ත පාලනය

(A) රාජ්‍ය බලය රජු වටා කේන්ද්‍රගතව තිබිණි.

(B) පියාගෙන් පුතුට රාජ්‍ය උරුමය පැවරිණි.

(C) රජුගේ ඉහළ ම නිලධරයා ධර්ම මහාමාත්‍ර නම් විය.

(D) ගුප්ත අධිරාජ්‍යයේ ඉහළ ම ප්‍රාදේශීය පරිපාලන ඒකකය මණ්ඩල නම් විය. (.......)

**29.** බදාමියේ චාලුක්‍යයෝ

(A) බදාමි චාලුක්‍යයෝ පල්ලවයන්ගේ සමකාලීනයෝ වූහ.

(B) වාතාපි අගනුවර ලෙස තෝරා ගන්නා ලද්දේ දෙවන පුලකේශීන් විසිනි.

(C) මෙම වංශයේ මුල් වැදගත්ම පාලකයා පළමුවන පුලකේශීන් ය.

(D) දෙවන පුලකේශීන් විසින් අරාබි ආක්‍රමණිකයන් පළවා හරින ලදී. (.......)

**30.** හර්ෂවර්ධන රජුගේ කනෞජ් සම්මේලනය

(A) කනෞජ් සම්මේලනය පවත්වන ලද්දේ හියුං සාං භික්ෂුවට ගෞරව පිණිස ය.

(B) මෙම සම්මේලනයට රජවරු 20 දෙනෙක් පමණ සහභාගී වූහ.

(C) සම්මේලනය අවසානයේ දී හර්ෂවර්ධන රජු ඝාතනය කිරීමට බ්‍රාහ්මණයන් විසින් උත්සාහ දරා ඇත.

(D) මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් හියුං සාං හිමිගේ වාර්තාවේ සඳහන් වේ. (.......)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** මහායාන බෞද්ධ ග්‍රන්ථ රචනා කොට ඇති ප්‍රධාන භාෂාව කුමක් ද?

(1) ප්‍රාකෘත (2) සංස්කෘත (3) පාලි (4) මලයාලම් (5) තෙළිඟු (.......)

**32.** අශෝක අධිරාජයා විසින් ඛරෝෂ්ඨී භාෂාවෙන් ලියන ලද අභිලේඛනය කුමක් ද?

(1) ගිර්නාර් (2) බරාබර් (3) ධෞලි (4) මස්කි (5) බ්‍රහ්මගිරි (.......)

**33.** රාෂ්ට්‍රකූට රජ පෙළපතේ ආරම්භක රජතුමා කවරෙක් ද?

(1) ඉන්ද්‍රරාජ (2) කෘෂ්ණ (3) දන්තිවර්මන් (4) දන්තිදුර්ග (5) පළමුවන ඉන්ද්‍ර (.......)

**34.** ගන්ධාර දේශයට එල්ල වූ හූණ ආක්‍රමණ ප්‍රථමයෙන් ම මර්දනය කරන ලද්දේ කවර ගුප්ත රජු විසින් ද?

(1) ස්කන්ධගුප්ත (2) පුරු ගුප්ත (3) භානු ගුප්ත
(4) බුධ ගුප්ත (5) වෛන්‍ය ගුප්ත (.......)

**35.** ඝස්නි මහමුද්ගේ අවසාන ආක්‍රමණය එල්ල වූ ස්ථානය කුමක් ද?

(1) පෙෂාවෝර් (2) මුල්තානය (3) සෝමනාත් (4) තානේශ්වර් (5) රාජ්පුතානා (.......)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** හා **5** යන කවර විග්‍රහය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

| | පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **1** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **2** | නිවැරදි ය. | වැරදි ය. |
| **3** | වැරදි ය. | නිවැරදි ය. |
| **4** | වැරදි ය. | වැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශනය | දෙවැනි ප්‍රකාශනය | |
|---|---|---|---|
| **36.** | ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අදාළ මෑත කාලීන කැණීම් අනුව රබිගාර් වනාහි වාණිජ හා පරිපාලන මධ්‍යස්ථානයකි. | හරප්පා වැසියන් මෙසපොතේමියානු වැසියන් සමග වාණිජ සබඳතා පවත්වන ලදී. | (.......) |
| **37.** | පශ්චාත් වෛදික යුගයේ දී දකුණු ප්‍රදේශයෙහි රජවරු විරාට් යන විරුදයෙන් හඳුන්වන ලදී. | පශ්චාත් වෛදික යුගයේ දී පෙරදිග රජවරු සාම්රාට් යන විරුදයෙන් හඳුන්වා ඇත. | (.......) |
| **38.** | පශ්චාත් මෞර්ය යුගයේ දී බටහිරින් පැමිණි කණ්ඩායම් කිහිපයක් වයඹ දිග ඉන්දියාවේ දේශපාලන බලය පිහිටු වීමට සමත් වූහ. | ඉන්දු-ග්‍රීක, ශක, පාර්තියන්, කුෂාණ යන ජන කණ්ඩායම් අනුපිළිවෙළින් පූර්ව ගුප්ත යුගයෙහි දී වයඹ දිග ඉන්දියාවේ ආධිපත්‍ය පිහිට වූහ. | (.......) |
| **39.** | මධ්‍යාසියානු සංචාරක ගෝත්‍රයක් වූ ශකවරු සිතියන් යන නමින් ද හඳුන්වා ඇත. | ශකවරුන්ගේ බලවත් ම රජු මිනැන්ඩර් රජු ලෙසට සැලකේ. | (.......) |
| **40.** | රාෂ්ට්‍රකූටයන්ගේ අගනුවර ප්‍රතිෂ්ඨාන් විය. | රාෂ්ට්‍රකූටයෝ නැඟෙනහිර හා බටහිර යනුවෙන් කොටස් දෙකකට බෙදී සිටියහ. | (.......) |

* *

# (25 A) ඉන්දීය ඉතිහාසය

**(ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා)**

**II පත්‍රය (II කොටස)**

සැලකිය යුතුයි.

* **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **එක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **තුනකට ද** පිළිතුරු සපයන්න.

(පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ඉන්දියාවේ දළ සිතියමක්** සපයා ඇත.)

---

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න**.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **(i)** | ඛයිබර් දුර්ගය | **(ii)** | වින්ධ්‍යා කඳුවැටිය | **(iii)** | හරප්පා | **(iv)** | තාම්‍රලිප්ත |
| **(v)** | ගෝදාවරී ගඟ | **(vi)** | කනෞජ් | **(vii)** | තංජෝර් | **(viii)** | සෞරාෂ්ට්‍ර |
| **(ix)** | පාටලීපුත්‍ර | **(x)** | වාතාපි | **(xi)** | උජ්ජේනි | **(xii)** | තක්ෂිලා |

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)

## B කොටස

**2.** ''හරප්පා ශිෂ්ටාචාරය නාගරික ශිෂ්ටාචාරයකි.''

**(i)** හරප්පා සභ්‍යත්වයට අදාළ කැණීම්වලින් මතු කරගත් පැරණි නගරයක් නම් කරන්න. (ලකුණු 01යි)

**(ii)** එම ශිෂ්ටාචාරයට අදාළ කැණීම් කළ පුරාවිද්‍යාඥයන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02යි)

**(iii)** හරප්පා ශිෂ්ටාචාරයේ අර්ථක්‍රමය සැකෙවින් දක්වන්න. (ලකුණු 04යි)

**(iv)** ''හරප්පා ශිෂ්ටාචාරය නාගරික ශිෂ්ටාචාරයකි.'' යන ප්‍රකාශය පිළිබඳ ව ඔබේ අදහස් පැහැදිලි කරන්න. (ලකුණු 09යි)

**3.** පශ්චාත් වෛදික යුගයේ සමාජ-ආර්ථික ව්‍යුහය පරීක්ෂා කරන්න. (ලකුණු 16යි)

**4.** '' අශෝක අධිරාජයා, මෞර්ය වංශයේ ශ්‍රේෂ්ඨතමයා විය'' මේ ප්‍රකාශය විචාරාත්මක ව විමසන්න. (ලකුණු 16යි)

**5.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව සටහන් ලියන්න.

**(i)** ක්‍රිෂ්ණා-තුංගබද්‍රා දෙගම්මැදිය

**(ii)** ගණ රාජ්‍යය

**(iii)** නන්ද රාජවංශය

**(iv)** සංගම් සාහිත්‍යය (එක් සටහනකට ලකුණු 08 බැගිනි)

## C කොටස

**6.** ඩෙකානයේ දේශපාලන හා සංස්කෘතික අභිවර්ධනයෙහි ලා සාතවාහනයන්ගෙන් ඉටු වී ඇති සේවය ප්‍රමාණ කරන්න. (ලකුණු 16යි)

**7.** ''දෙවන චන්ද්‍රගුප්ත රජු ගුප්ත රාජවංශයෙහි ශ්‍රේෂ්ඨතමයා විය.''

**(i)** ගුප්ත යුගයේ ආරම්භක පාලකයා නම් කරන්න. (ලකුණු 01යි)

**(ii)** ගුප්ත යුගය පිළිබඳ තොරතුරු ලබාගත හැකි ප්‍රධාන මූලාශ්‍ර **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

**(iii)** දෙවැනි චන්ද්‍රගුප්ත රජුට පෙර සිටි පාලකයින් ගුප්ත අධිරාජ්‍යයේ වර්ධනය පිණිස ඉටුකළ කාර්යභාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 05යි)

**(iv)** දෙවැනි චන්ද්‍ර ගුප්ත රජු ගුප්ත අධිරාජ්‍යයේ ශ්‍රේෂ්ඨතමයා වන්නේ කෙසේදැයි ඔහුගේ දේශපාලන හා සංස්කෘතික කාර්යභාරය ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 08යි)

**8.** දකුණු ඉන්දියාවේ චෝළ පාලනය යටතේ සිදු වූ සංස්කෘතික ප්‍රබෝධය පහත සඳහන් මාතෘකා ඇසුරින් සාකච්ඡා කරන්න.

**(i)** හින්දු ආගමික ප්‍රබෝධය

**(ii)** කලා හා ගෘහනිර්මාණ ශිල්පය (ලකුණු 16යි)

**9.** පහත දැක්වෙන මාතෘකාවලින් **දෙකක්** පිළිබඳ ව ඓතිහාසික සටහන් ලියන්න.

**(i)** බටහිර චාලුක්‍ය රාජ වංශය

**(ii)** හර්ෂ රජුගේ දේශපාලන ජයග්‍රහණ

**(iii)** පල්ලව සංස්කෘතිය

**(iv)** පාල රාජවංශය

(එක් සටහනකට ලකුණු 08 බැගිනි)

* * *

# (25 A) ඉන්දීය ඉතිහාසය

**(ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා)**

**II කොටස**

1.



# (25 B) යුරෝපා ඉතිහාසය

**(ග්‍රීක - රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා)**

**I පත්‍රය (I කොටස)**

සැලකිය යුතුයි.

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

---

- අංක **01** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග **නොගැළපේ**. එම **නොගැළපෙන** නම කුමක් දැයි හඳුනාගෙන එහි **අංකය** වරහන තුළ ලියන්න.

**1.** (1) ස්පාර්ටා (2) තීබ්ස් (3) ක්‍රිමියා (4) කොරින්ත් (5) මිලෙටස් (.......)

**2.** (1) ඊස්කිලස් (2) සොෆොක්ලීස් (3) යුරිපිඩීස් (4) ඇරිස්ටොෆනීස් (5) වර්ජිල් (.......)

**3.** (1) සෝලෝන් (2) ඔගස්ටස් (3) ක්ලෝඩියස් (4) ට්‍රාජන් (5) මාකස් අවුරේලියස් (.......)

**4.** (1) විසිගොත්වරු (2) ටාටාර්වරු (3) වැන්ඩල්වරු (4) ලොම්බාර්ඩ්වරු (5) ඇංග්ලෝ-සැක්සන්වරු (.......)

**5.** (1) බොලොඤ්ඤා (2) පැරිස් (3) ඔක්ස්ෆර්ඩ් (4) අබෙලාර්ඩ් (5) කේම්බ්‍රිජ් (.......)

**6.** (1) කැස්ටිල් (2) ඇරගන් (3) නෝමන්ඩි (4) ග්‍රැනඩා (5) නවාර් (.......)

**7.** (1) ස්ෆෝර්සා (2) මෙඩිචි (3) එස්තෙ (4) ගොන්සාගා (5) යෝර්ක් (.......)

**8.** (1) මැකියාවෙලී (2) ඉග්නේෂියස් ලොයලා (3) තොමස් හොබ්ස් (4) ජෝන් ලොක් (5) ජීන් ජැක් රූසෝ (.......)

**9.** (1) මැසරීන් (2) අබේ සියෙස් (3) මිරාබෝ (4) ලෆායට් (5) රොබෙස්පියර් (.......)

**10.** (1) වර්සායි (2) ශාන්ත ජර්මේන් (3) ට්‍රියනොන් (4) නියුලි (5) ලන්ඩන් (.......)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක් දැයි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.** (1) ටයිබර් ගඟ - මධ්‍යධරණී මුහුද
(2) සේන් ගඟ - ඉංග්‍රීසි ඕඩය
(3) රයින් ගඟ - උතුරු මුහුද
(4) තේම්ස් ගඟ - බෝල්ටික් මුහුද
(5) ඩැනියුබ් ගඟ - කළු මුහුද (.......)

**12.** (1) ජෝන් වයික්ලිෆ් - එංගලන්තය
(2) ජෝන් හස් - ඔස්ට්‍රියාව
(3) මාටින් ලූතර් - ජර්මනිය
(4) උල්රිච් ස්විංලි - ස්විට්සර්ලන්තය
(5) ජෝන් කැල්වින් - ප්‍රංශය (.......)

13. (1) බර්තෝලමියු ඩයස් - අප්‍රිකාවේ දකුණු තුඩුව දක්වා යාත්‍රා කිරීම
(2) ක්‍රිස්ටෝෆර් කොලම්බස් - බටහිර ඉන්දියා දූපත්වලට යාත්‍රා කිරීම
(3) නාවික හෙන්රි - නව ලෝකය සොයා ගැනීම
(4) වස්කෝ ද ගාමා - කැලිකට් වරායට පැමිණීම
(5) ෆර්ඩිනන්ඩ් මැගලන් - ලෝකය වටා යාත්‍රා කිරීම (.......)

14. (1) ටැලිරැන්ඩ් - ප්‍රංශය
(2) මෙටර්නික් - ඔස්ට්‍රියාව
(3) කාසල්රී - බ්‍රිතාන්‍යය
(4) පළමුවන සාර් ඇලෙක්සැන්ඩර් - රුසියාව
(5) ජෝර්ජ් කැනිං - ප්‍රශියාව (.......)

15. (1) ට්‍රිග්වි ලී - නෝර්වේ
(2) ඩැග් හැමර්ෂල් - ස්වීඩන්
(3) උ තාන් - තායිලන්තය
(4) කුර්ට් වෝල්ඩ්හයිම් - ඔස්ට්‍රියාව
(5) පෙරේස් ඩි කුවෙලාර් - පේරු (.......)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ ප්‍රකාශන/ දින වකවානු සමූහයක් **X** හා **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම/ ප්‍රකාශන/ දින වකවානු, **X** තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ**. **Y** තිරුව, **X** තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන** තුළ ලියන්න.

**16.**

| X | Y |
|---|---|
| (i) මානවවාදය | A එක් ජාතියක්, සංස්කෘතියක් හා භාෂාවක් උරුම කරගත් ජන කොටසක් ස්වාධීන රටක් නිර්මාණය කර ගැනීමට දක්වන කැමැත්ත |
| (ii) දේවවරම්වාදය | B මිනිසාගේ උදාරබව හා ස්වකීය ඉරණම පාලනය කිරීමට ඔහුට ඇති හැකියාව පිළිබඳ අවධාරණය |
| (iii) ජාතිකවාදය | C රජයේ පාලනයෙන් තොරව ආර්ථිකය වර්ධනය වීමට ඉඩ හැරීම පිළිබඳ ප්‍රතිපත්තිය |
| (iv) රාජ්‍යනිර්බාධවාදය | D විශාලතම ජන සංඛ්‍යාවට උපරිම සතුට පිළිබඳ විශ්වාසය |
| (v) උපයෝගිතාවාදය | E රජෙකුට පාලනය කිරීමේ අයිතිය සෘජුව ම දෙවියන්ගෙන් ලැබෙනවාය යන විශ්වාසය |

(1) A B E C D (2) A E D C B (3) B A C D E (4) B E A C D (5) D E A B C (.......)

**17.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | මහාධිකාර පත්‍රය | A | රොබට් වෝල්පෝල් |
| (ii) | රජු එංගලන්ත පල්ලියේ නායකයා ලෙස ප්‍රකාශයට පත් කිරීම | B | දෙවන ජේම්ස් රජතුමා |
| (iii) | ප්‍රසිද්ධියේ මරණීය දණ්ඩනයට පත් කරන එංගලන්තයේ රජතුමා | C | අටවන හෙන්රි රජතුමා |
| (iv) | එංගලන්තයේ පළමුවන අගමැතිවරයා | D | ජෝන් රජතුමා |
| (v) | උත්කෘෂ්ට විප්ලවය ඇතිවන විට එංගලන්තයේ සිටි රජතුමා | E | පළමුවන චාල්ස් රජතුමා |

(1) D C E A B (2) D C E B A (3) D E A B C (4) E A C D B (5) E C A B D (.......)

**18.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | කොන්ස්තන්තිනෝපලය, තුර්කි බලයට යටත් වීම | A | ප්‍රංශ විප්ලවය |
| (ii) | බොස්ටන් තේ සාදය | B | පුනරුදය |
| (iii) | එස්ටේට්ස් ජෙනරල් සභාව කැඳවීම | C | පළමුවන ලෝක යුද්ධය |
| (iv) | සරයේවෝහි ඝාතනය | D | අමෙරිකා එක්සත් ජනපදය දෙවන ලෝක යුද්ධයට පිවිසීම |
| (v) | ජපානය පර්ල් වරායට පහර දීම | E | අමෙරිකානු විප්ලවය |

(1) A B D E C (2) B A C D E (3) B A E D C (4) B E A C D (5) C D A E B (.......)

**19.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ''පාලකයාගේ ආගම රටවැසියාගේ ද ආගම විය යුතු ය.'' | A | මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය |
| (ii) | ''පාර්ලිමේන්තුවේ අනුමැතියෙන් තොරව රජතුමාට බදු පැනවිය නොහැකි ය.'' | B | වර්සායි ගිවිසුම |
| (iii) | ''නිදහස්ව උපත ලබා ඇති මිනිසුන්ට සමාන අයිතිවාසිකම් තිබේ.'' | C | වියනා සම්මේලනය |
| (iv) | නීත්‍යානුකූලවාදය පිළිබඳ මූලධර්මය | D | 1689 අයිතිවාසිකම් පනත |
| (v) | ජාතීන්ගේ ස්වයං නිර්ණය පිළිබඳ මූලධර්මය | E | ඔග්ස්බර්ග් සාම ගිවිසුම |

(1) A C E D B (2) A E D B C (3) D E C A B (4) E A D B C (5) E D A C B(.......)

**20.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | 1688 ඉංග්‍රීසි විප්ලවය | A | ආදි තන්ත්‍රයේ හා රදළ ආධිපත්‍යයේ අවසානය |
| (ii) | කාර්මික විප්ලවය | B | බුද්ධිමතුන්ගේ විප්ලව |
| (iii) | ප්‍රංශ විප්ලවය | C | පාර්ලිමේන්තුව බලවත් වීම හා ව්‍යවස්ථානුකූල ආණ්ඩුවක් පිහිටුවීම |
| (iv) | 1848 විප්ලව | D | නිර්ධන පන්තියේ ආඥාදායකත්වය |
| (v) | බොල්ෂෙවික් විප්ලවය | E | නව අධිරාජ්‍යවාදය ඇතිවීමට මඟ පෑදීම |

(1) B A E D B (2) C E A B D (3) C A B D E (4) D E C B A (5) E D A B C (.......)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**21. ප්‍රොතෙස්තාන්ත රෙපරමාදු ව්‍යාපාරය**

(1) ජර්මනියේ ආරම්භ විය.
(2) කතෝලික පල්ලියේ දූෂණවලට එරෙහිව මතු විය.
(3) මාටින් ලූතර් නායකත්වය ගත්තේ ය.
(4) ටෙට්සල් ප්‍රොතෙස්තාන්ත ව්‍යාපාරයේ ප්‍රධාන ආධාරකරුවෙකු විය.
(5) ප්‍රොතෙස්තාන්ත රෙපරමාදු ව්‍යාපාරය යුරෝපයේ බොහෝ රටවල පැතිර ගියේ ය. (.......)

**22.** 1848 **විප්ලව**

(1) ජාතිකවාදය හා ලිබරල්වාදය විප්ලව ඇති වීමට හේතු විය.
(2) විප්ලව පැරීසියෙන් ආරම්භ විය.
(3) යුරෝපයේ නගර ගණනාවක විප්ලව හටගත්තේ ය.
(4) ලුවී නැපෝලියන් යටතේ ප්‍රංශයේ දෙවන සමූහාණ්ඩුව පිහිටවනු ලැබී ය.
(5) ෆ්‍රැන්ක්ෆර්ට් සම්මේලනය මෙටර්නික්ගේ නායකත්වය යටතේ පවත්වන ලදී. (.......)

**23. ඉතාලිය එක්සත් කිරීම**

(1) පීඩ්මොන්ට්-සාර්ඩිනියා රාජ්‍යය නායකත්වය ගත්තේ ය.
(2) පාප් වහන්සේගේ ආශිර්වාදය ඇති ව ඉතාලිය එක්සත් කරන ලදී.
(3) කැවුර් ඉතාලිය එක්සත් කිරීමේ ප්‍රධාන නිර්මාපකයා විය.
(4) ගැරිබෝල්ඩි දකුණු ඉතාලිය යටත් කළේ ය.
(5) රෝමය එක්සත් ඉතාලියේ අගනුවර විය. (.......)

**24. පළමුවන ලෝක යුද්ධය**

(1) යුරෝපා රටවල් බල කඳවුරු දෙකකට බෙදීම පළමුවන ලෝක යුද්ධය ඇති වීමට මඟපෑදීම
(2) ඉතාලිය මිත්‍ර පක්ෂය ගෙන යුද්ධයට අවතීර්ණ වීම
(3) මිත්‍ර පක්ෂයේ ජයග්‍රහණයෙහි ලා අමෙරිකා එක්සත් ජනපදය වැදගත් මෙහෙවරක් ඉටු කිරීම
(4) යුද්ධයේ පරාජය පිළිබඳ වගකීම භාරගත් බිස්මාර්ක් ජර්මනියේ චාන්සලර් ධූරයෙන් ඉවත් වීම
(5) ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා ජාතීන්ගේ සංගමය පිහිටුවීම (.......)

**25. දෙවන ලෝක යුද්ධයෙන් පසු සෝවියට් දේශය**

(1) ජෝශප් ස්ටාලින් විසින් නව ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දෙනු ලැබී ය.
(2) බටහිර රටවල් සමග සාමකාමී සහජීවනයක් අවශ්‍ය යයි නිකිතා කෘෂෙෆ් ප්‍රකාශ කළේ ය.
(3) බ්‍රෙෂ්නෙෆ් හා අන්ද්‍රපොෆ් සෝවියට් දේශයේ සිටි පාලකයන් දෙදෙනෙකි.
(4) මිහායල් ගෝර්බචොෆ් පෙරෙස්ත්‍රොයිකා හෙවත් ආර්ථික ප්‍රතිව්‍යුහකරණය නම් ප්‍රතිපත්තිය හඳුන්වා දුන්නේ ය.
(5) සෝවියට් දේශයේ බිඳ වැටීම නිරවි යුද්ධය අවසන් වීමට හේතු විය. (.......)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A), (B), (C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන්, **එකක් හෝ කිහිපයක්** හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

  **(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
  **(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
  **(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
  **(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
  ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ................ **5** ද වරහන් තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

**26.** යුරෝපයේ ජාතික රාජ්‍ය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) පහළොස්වන හා දහසයවන සියවස්වල යුරෝපයේ නැගී ආ සුවිශේෂී දේශපාලන සංවිධානයක් ජාතික රාජ්‍යය නමින් හැඳින් වේ.
(B) ප්‍රංශය හා එංලන්තය යන රටවල ජාතික රාජ්‍ය බිහි විය.
(C) බලවත් මධ්‍යම ආණ්ඩුවක් ජාතික රාජ්‍යවල පැවතුණි.
(D) ජාතික රාජ්‍යවල නිශ්චිත දේශසීමා දක්නට ලැබුණි. (.......)

**27.** බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තු ක්‍රමයේ වර්ධනය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ස්ටුවර්ට් රාජවංශ සමයේ දී රජතුමා හා පාර්ලිමේන්තුව අතර සමීප හා සුහද සබඳතා පැවතුණි.
(B) 1688 දී සර්වජන ඡන්ද බලය ප්‍රදානය කෙරිණි.
(C) මුල්කාලීන හැනොවේරියන් රජවරුන් යටතේ අගමැතිධූරය මුල්බැස ගත්තේ ය.
(D) 1911 පාර්ලිමේන්තු පනතින් සාමි මන්ත්‍රී මණ්ඩලයේ බලතල අඩු කරන ලදී. (.......)

**28.** පහත දැක්වෙන කරුණු අතුරෙන් අමෙරිකානු නිදහස් සටනේ ප්‍රතිඵල කවරේ ද?
(A) අමෙරිකා එක්සත් ජනපද රාජ්‍යය බිහි වීම
(B) ෆෙඩරල් ආණ්ඩුක්‍රමයක් පිහිටු වීම
(C) උතුර හා දකුණ ලෙස දෙකඩ වීම
(D) වහලුන්ට නිදහස ප්‍රදානය කිරීම (.......)

**29.** පහත දැක්වෙන කරුණු අතුරෙන් දෙවන ලෝක යුද්ධයේ ප්‍රතිඵල කවරේ ද?
(A) ලෝකයේ දරුණුතම විනාශය සිදු වීම
(B) ජාතීන්ගේ සංගමය පිහිටු වීම
(C) යුරෝපයේ යටත් විජිත අධිරාජ්‍ය බිඳ වැටීම
(D) ජර්මනියේ හා ජපානයේ යුද වාදය නැගී ඒම (.......)

**30.** එක්සත් ජාතීන්ගේ සංවිධානය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලස්ථානය ජිනීවා හි පිහිටා තිබේ.
(B) 1945 සැන් ෆ්‍රැන්සිස්කෝ ප්‍රඥප්තිය යටතේ එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවන ලදී.
(C) අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම එහි ප්‍රධානතම අරමුණ යි.
(D) කොන්රඩ් ඇඩිනුවර් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රථම මහලේකම්වරයා විය. (.......)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**31.** පුරාණ රෝම අධිරාජයා කවු ද?
(1) ක්ලීස්තිනීස් (2) පෙරික්ලීස් (3) හැනිබාල් (4) සිසරෝ (5) ගැලේරියස් (.......)

**32.** පුරාණ රෝම වට මඬල **(Amphitheatre)** කුමක් ද?
(1) පාර්තිනොන් (2) සියුස් දෙවොල (3) කොලොසියම (4) බැසිලිකාව (5) වතිකානුව (.......)

**33.** කුරුස යුද්ධ ඇති වූයේ කවර ජනකොටස් අතර ද?

(1) රෝමවරුන් හා කාර්තේජිවරුන් අතර

(2) රෝමවරුන් හා ගොත්වරුන් අතර

(3) වයිකිවරුන් හා මාග්යාවරුන් අතර

(4) ක්‍රිස්තියානි භක්තිකයන් හා ඉස්ලාම් භක්තිකයන් අතර

(5) ටියුටොනික්වරුන් හා ස්ලාව්වරුන් අතර (.......)

**34.** මයිකලාංජිලෝගේ චිත්‍ර දැකිය හැකි දේවස්ථානය කුමක් ද?

(1) නෝත්‍ර දාම් දේවස්ථානය (2) මොන්ටි කැසීනෝ දේවස්ථානය

(3) සැලිස්බරි දේවස්ථානය (4) විටෙන්බර්ග් දේවස්ථානය

(5) සිස්ටයින් දේවස්ථානය (.......)

**35.** සූර්ය කේන්ද්‍රවාදය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?

(1) ටොලමි (2) නිකොලස් කොපර්නිකස්

(3) ජොහැන්නස් කෙප්ලර් (4) ගැලීලියෝ ගැලිලි

(5) අයිසැක් නිව්ටන් (.......)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** හා **5** යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

| | **පළමු වැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **2** | නිවැරදි ය. | වැරදි ය. |
| **3** | වැරදි ය. | නිවැරදි ය. |
| **4** | වැරදි ය. | වැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර, **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශනය | දෙවැනි ප්‍රකාශනය | |
|---|---|---|---|
| **36.** | ග්‍රීක රාජ්‍ය යටත් කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස රෝමවරු ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ආභාසය ලැබූ හ. | ග්‍රීකයන්ගෙන් විද්‍යාත්මක චින්තනය, සාහිත්‍යය, දර්ශනය හා භූගෝල විද්‍යාව පිළිබඳ දැනුම ලබාගත් රෝමවරු එහි ප්‍රතිඵලයක් ලෙස මානව බුද්ධිය අගය කිරීමට ද පටන් ගත්හ. | (.......) |
| **37.** | "Gold, God and Glory" හෙවත් ''රන්රන්, දෙවියන් වහන්සේ හා කීර්තිය'' යන ප්‍රකාශයෙන් ස්පාඤ්ඤ දේශ ගවේෂණ ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණු මැනවින් පිළිඹිබු වේ. | ස්පාඤ්ඤ ජාතික යාත්‍රිකයෙකු වූ පේද්‍රෝ අල්වාරේස් කබ්රාල් මෙක්සිකෝව යටත් කළේ ය. | (.......) |
| **38.** | ක්‍රි.ව. 1763 දී අත්සන් කරන ලද පැරිස් ගිවිසුමෙන් හත් අවුරුදු යුද්ධය අවසන් විය. | වියනා සම්මේලනයෙන් පසු අන්තර්ජාතික සාමය අරමුණු කරගෙන කෙටි කලක් ක්‍රියාත්මක වූ යුරෝපීය එකමුතුව යුරෝපා සම්මේලන ක්‍රමය නමින් හැඳින් වේ. | (.......) |
| **39.** | ගිරොඩින් නායක ඔලිවර් ක්‍රොම්වෙල් විසින් දහසය වන ලුවී රජතුමා වෙත මරණීය දණ්ඩනය පනවන ලදී. | ක්‍රි.ව. 1917 මාර්තු මස රුසියාවේ බලයට පත් වූ තාවකාලික ආණ්ඩුව විසින් දෙවන නිකොලස් අධිරාජයා ප්‍රසිද්ධියේ මරණයට පත් කරන ලදී. | (.......) |
| **40.** | ලියොන් ට්‍රොට්ස්කි තනිරටේ සමාජවාදය නම් සංකල්පය ඉදිරිපත් කළේ ය. | ක්‍රි.ව.1929 ලැටරන් ගිවිසුමෙන් මුසෝලිනි පාප් වහන්සේ සමග දේශපාලන එකඟත්වයක් ඇති කර ගත්තේ ය. | (.......) |

* *

# (25 B) යුරෝපා ඉතිහාසය

**(ග්‍රීක - රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා)**

**II පත්‍රය (II කොටස)**

සැලකිය යුතුයි.

* **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **එක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **තුනකට ද** පිළිතුරු සපයන්න.

(පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා යුරෝපයේ දළ සිතියමක් සපයා ඇත.)

---

**A කොටස**

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **(i)** | ඩැනියුබ් ගඟ | **(ii)** | යූරල් කඳුවැටිය | **(iii)** | බෝල්ටික් මුහුද | **(iv)** | ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය |
| **(v)** | ඇතන්ස් | **(vi)** | කොන්ස්තන්තිනෝපලය | **(vii)** | පැරිස් | **(viii)** | ෆ්ලොරන්ස් |
| **(ix)** | පෝලන්තය | **(x)** | ශාන්ත පීටර්ස්බර්ග් | **(xi)** | ලිවර්පූල් | **(xii)** | කීල් ඇළ |

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.)

**B කොටස**

**2.** පහත සඳහන් ක්ෂේත්‍ර ඇසුරෙන් පුරාණ ග්‍රීක සභ්‍යත්වයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

**(i)** පෞර රාජ්‍ය ක්‍රමය

**(ii)** කලාව සහ සාහිත්‍යය (ලකුණු 16යි)

**3.** ''පුනරුදය, යුරෝපයේ සංස්කෘතික හා බුද්ධිමය විකාසනයේ සන්ධිස්ථානයක් සලකුණු කරයි. ''

**(i)** පුනරුදය ආරම්භ වූ රට නම් කරන්න. (ලකුණු 01යි)

**(ii)** ''පුනරුදය'' යන්නෙන් අදහස් කරන්නේ කුමක් දැයි නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

**(iii)** පුනරුදය ඇති වීමට තුඩු දුන් ප්‍රධාන සාධක ගෙන හැර දක්වන්න. (ලකුණු 05යි)

**(iv)** පුනරුදය, යුරෝපයේ සංස්කෘතික හා බුද්ධිමය විකාසනයේ සන්ධිස්ථානයක් සලකුණු කරන අයුරු පරීක්ෂා කරන්න. (ලකුණු 08යි)

**4.** ''කාර්මික විප්ලවය යුරෝපයේ තාක්ෂණික, ආර්ථික හා සාමාජික ක්ෂේත්‍රවල මූලික පරිවර්තනයක් ඇති කළේ ය.'' සාකච්ඡා කරන්න. (ලකුණු 16යි)

**5.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

**(i)** පෘතුගාලය නිරත වූ දේශ ගවේෂණ

**(ii)** තිස් අවුරුදු යුද්ධය

**(iii)** අමෙරිකානු විප්ලවය ඇති වීමට තුඩු දුන් හේතු

**(iv)** ප්‍රංශයේ ආදි තන්ත්‍රය

(එක් කෙටි සටහනකට ලකුණු 08 බැගිනි)

## C කොටස

6. ''නැපෝලියන් බොනපාට් ප්‍රංශ සමාජයේ සෑම අංශයක් ම සම්බන්ධයෙන් චිරස්ථායි බලපෑමක් ඇති කළේ ය.''

   **(i)** නැපෝලියන් බොනපාට් උපන් ප්‍රදේශය නම් කරන්න. (ලකුණු 01යි)

   **(ii)** නැපෝලියන් බොනපාට්ගේ ආක්‍රමණවලට ලක් වූ රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි)

   **(iii)** නැපෝලියන් බොනපාට් ප්‍රංශයේ බලය අත්පත් කරගත් ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

   **(iv)** නැපෝලියන් බොනපාට්ගේ දේශීය ප්‍රතිපත්තිය ඇසුරෙන් ඔහු ප්‍රංශ සමාජය කෙරෙහි චිරස්ථායි බලපෑමක් ඇති කළ අයුරු විස්තර කරන්න. (ලකුණු 09යි)

7. ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරය පහත සඳහන් තේමා ඇසුරෙන් පරීක්ෂා කරන්න.

   **(i)** ක්‍රි.ව. 1815 සිට ක්‍රි.ව. 1848 දක්වා වූ කාලය තුළ ජර්මනිය එක්සත් කිරීමට එරෙහි ව පැවති බාධක

   **(ii)** බිස්මාර්ක් ඉටුකළ කාර්යභාරය (ලකුණු 16යි)

8. දෙවන ලෝක යුද්ධය ඇති වීමට තුඩු දුන් හේතු විචාරාත්මක ව විමසන්න. (ලකුණු 16යි)

9. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

   **(i)** වියනා සම්මේලනය

   **(ii)** ඉතාලි එක්සත් ව්‍යාපාරයෙහිලා කැවුර් විසින් ඉටු කරන ලද කාර්යභාරය

   **(iii)** බොල්ෂෙවික් විප්ලවය

   **(iv)** නිරවි යුද්ධය (එක් කෙටි සටහනකට ලකුණු 08 බැගින්)


* * *

# (25 B) යුරෝපා ඉතිහාසය

**(ග්‍රීක - රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා)**

**II කොටස**

1.



# (25 C) නූතන ලෝක ඉතිහාසය

**(ක්‍රි.ව. 1500 සිට ක්‍රි.ව. 1989 දක්වා)**

**II පත්‍රය (I කොටස)**

සැලකිය යුතුයි.
* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

---

- අංක **01** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග **නොගැළපේ**. එම **නොගැළපෙන** නම කුමක් දැයි හඳුනාගෙන එහි **අංකය** වරහන තුළ ලියන්න.

**1.** (1) මිසිසිපි (2) කියුබා (3) තේම්ස් (4) නයිජර් (5) ඉරවඩි (.......)

**2.** (1) පෙට්රාක් (2) මැකියාවෙලී (3) ෆුගර්ස් (4) තෝමස් මෝර් (5) ඉරාස්මස් (.......)

**3.** (1) ජෝන් වයික්ලිෆ් (2) ජෝන් හස් (3) මාර්ටින් ලූතර්
(4) ජෝන් කැල්වින් (5) ෆ්‍රැන්සිස් ක්ෂාවියර් (.......)

**4.** (1) ප්‍රෙස්ටර් ජෝන් (2) කාටියර් (3) ජොලියට් (4) ලා සලෙ (5) මාක්වෙටේ(.......)

**5.** (1) අයිතිවාසිකම් පනත
(2) මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය
(3) මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය
(4) ඇපාර්තීඩ්
(5) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (.......)

**6.** (1) වෙනිසුවෙලාව (2) ආර්ජන්ටිනාව (3) කොළොම්බියාව
(4) පේරු (5) නයිජීරියාව (.......)

**7.** (1) වුඩ්රෝ විල්සන් (2) ලොයිඩ් ජෝර්ජ්
(3) ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් (4) ජෝන් කෙනඩි
(5) ජිමී කාටර් (.......)

**8.** (1) ජවහර්ලාල් නේරු (2) ලාල් බහදූර් ශාස්ත්‍රි (3) මහත්මා ගාන්ධි
(4) ඉන්දිරා ගාන්ධි (5) රජීව් ගාන්ධි (.......)

**9.** (1) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)
(2) උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (NATO)
(3) වෝර්සෝ සම්මුතිය
(4) අග්නිදිග ආසියා ගිවිසුම් සංවිධානය (SEATO)
(5) මධ්‍යම ගිවිසුම් සංවිධානය (CENTO) (.......)

**10.** (1) නිකිතා කෘෂෙෆ්
(2) ඇලෙක්සෙයි කොසිජින්
(3) ලියොනිඩ් බ්‍රෙෂ්නෙෆ්
(4) ලෙච් වලේසා
(5) මිහායල් ගොර්බචෙෆ් (.......)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක් දැයි හඳුනාගෙන, ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**11.** (1) හින්දු ආගම - නේපාලය
(2) බුද්ධාගම - තායිලන්තය
(3) ඉස්ලාම් ආගම - ඉරානය
(4) යුදෙව් ආගම - ලෙබනනය
(5) කතෝලික ආගම - පිලිපීන දූපත් (.......)

**12.** (1) සියක් අවුරුදු යුද්ධය - එංගලන්තය හා ප්‍රංශය
(2) හත් අවුරුදු යුද්ධය - එංගලන්තය හා ප්‍රංශය
(3) නයිල් සටන - එංගලන්තය හා ප්‍රංශය
(4) ට්‍රැෆල්ගාර් සටන - එංගලන්තය හා ප්‍රංශය
(5) ක්‍රිමියන් යුද්ධය - එංගලන්තය හා ප්‍රංශය (.......)

**13.** (1) ස්ෆෝර්සා - මිලාන්
(2) වැලෝයි - වෙනීසිය
(3) මෙඩිචි - ෆ්ලෝරන්ස්
(4) එස්තෙ - ෆෙරාරා
(5) ගොන්සාගා - මැන්ටුවා (.......)

**14.** (1) දාහතර වන ලුවී - ''රාජ්‍යය යනු මම වෙමි.''
(2) නැපෝලියන් බොනපාට් - ''විප්ලවය යනු මම වෙමි.''
(3) කැමිලෝ කැවූර් - ''ඉතාලියට තනිවම නැගී සිටිය හැකි ය.''
(4) කාල් මාක්ස් - ''සියලු රටවල කම්කරුවනි, එක්සත් වන්න! ''
(5) වින්ස්ටන් චර්චිල් - ''බෝල්ටික් මුහුදේ සිට අද්‍රියාතික් මුහුද දක්වා අයෝමය කඩතුරාවක් වැටී ඇත.'' (.......)

**15.** (1) තායිවානය - තායිලන්තය
(2) මෙසපොතේමියාව - ඉරාකය
(3) පර්සියාව - ඉරානය
(4) බුරුමය - මියන්මාරය
(5) නැගෙනහිර පාකිස්තානය - බංග්ලාදේශය (.......)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ ප්‍රකාශන/ දින වකවානු සමූහයක් **X** හා **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම/ ප්‍රකාශන/ දින වකවානු, **X** තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ**. **Y** තීරුව, **X** තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

**16.**

| X | | Y |
|---|---|---|
| (i) ශුභ ප්‍රාර්ථනා තුඩුව | A | චීනය |
| (ii) නව ලෝකය | B | මහා බ්‍රිතාන්‍යය |
| (iii) නිදාසිටින යෝධයා | C | අප්‍රිකා මහද්වීපය |
| (iv) අඳුරු මහද්වීපය | D | අමෙරිකා මහද්වීපය |
| (v) හිරු නොබසින අධිරාජ්‍යය | E | අප්‍රිකාවේ දකුණු තුඩුව |

(1) A D C B E (2) B A D C E (3) C D A E B (4) E C D B A (5) E D A C B (.......)

**17.** **X** **Y**

| X | Y |
|---|---|
| (i) මෝගල් | A වියට්නාමය |
| (ii) මැංචු | B සියම |
| (iii) න්ගුයෙන් | C බුරුමය |
| (iv) කොන්බවුං | D ඉන්දියාව |
| (v) චක්‍රී | E චීනය |

(1) D A C B E (2) D B A E C (3) D E A C B (4) E C D A B (5) E D B C A(.......)

**18.** **X** **Y**

| X | Y |
|---|---|
| (i) ෆ්ලෝරන්ස් නයිටිංගේල් | A අභ්‍යවකාශයට පිවිසි ප්‍රථම කාන්තාව |
| (ii) මාරි කියුරී | B සුප්‍රසිද්ධ බ්‍රිතාන්‍ය හෙදිය හා නූතන හෙද සේවයේ නිර්මාතෘවරිය |
| (iii) වැලන්ටිනා තෙරෙශ්කෝවා | C ඊශ්‍රායලයේ ප්‍රථම කාන්තා අගමැතිනිය |
| (iv) ගෝල්ඩා මෙයර් | D බ්‍රිතාන්‍යයේ පළමු කාන්තා අගමැතිනිය |
| (v) මාගරට් තැචර් | E රේඩියම් සොයාගත් පෝලන්ත විද්‍යාඥවරිය |

(1) A B D E C (2) A C E D B (3) B E D A C (4) B E A C D (5) D A E C B(.......)

**19.** **X** **Y**

| X | Y |
|---|---|
| (i) අමෙරිකානු විප්ලවය | A ''ධනවත් රටක්, ශක්තිමත් හමුදාවක්'' |
| (ii) ප්‍රංශ විප්ලවය | B ''සාමය, ඉඩම් හා පාන්'' |
| (iii) මෙයිජි ප්‍රතිෂ්ඨාපනය | C ''නියෝජිතයන් නැතිනම් බදුත් නැත.'' |
| (iv) රුසියානු විප්ලවය | D ''ගොවියාට ඉඩම්'' සහ ''මහා ඉදිරි පිම්ම'' |
| (v) චීන විප්ලවය | E ''නිදහස, සමානාත්මතාව හා සහෝදරත්වය'' |

(1) B C A E D (2) C E A B D (3) C E B A D (4) D A E B C (5) E C A D B(.......)

**20.** **X** **Y**

| X | Y |
|---|---|
| (i) ට්‍රිග්වි ලී | A බුරුමය |
| (ii) ඩැග් හැමර්ෂල් | B පේරු |
| (iii) ඌ තාන් | C ඔස්ට්‍රියාව |
| (iv) කුර්ට් වෝල්ඩ්හයිම් | D ස්වීඩන් |
| (v) පෙරේස් ද කුවේලාර් | E නෝර්වේ |

(1) A C B E D (2) B D A E B (3) C A D B E (4) E B A C D (5) E D A C B(.......)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය ඉදිරියේ ඇති වරහන තුළ** ලියන්න.

**21.** පුනරුදය
(1) ඉතාලියේ ආරම්භ විය.
(2) නාවික හෙන්රි පුනරුදය හා සම්බන්ධ වැදගත් පුද්ගලයෙකි.
(3) පුනරුදය බටහිර යුරෝපයේ රටවල් බොහොමයක පැතිර ගියේ ය.
(4) මැකියාවෙලි ''කුමාරයා'' නම් ග්‍රන්ථය රචනා කළේ ය.
(5) දෙවන ජුලියස් පාප් වහන්සේ මයිකලාංජිලෝගේ සේවය ලබා ගත්තේ ය. (.......)

**22.** පෙරදිග ලන්දේසි අධිරාජ්‍යය

(1) දහසය වන සියවස අවසානයෙහි ලන්දේසීහු පෙරදිගට පැමිණිය හ.

(2) ක්‍රි.ව. 1602 දී එක්සත් ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම පිහිටුවන ලදී.

(3) යාන් පීටර්සෝ කුන් පෙරදිග ලන්දේසි අධිරාජ්‍යයේ නිර්මාපකයෙකු ලෙස සැලකේ.

(4) පෙරදිග ලන්දේසි අධිරාජ්‍යයේ මූලස්ථානය බතාවියාවේ ස්ථාපිත කොට තිබුණි.

(5) ක්‍රි.ව. 1591 දී ලන්දේසීහු පිලිපීන දූපත් යටත් කළහ. (.......)

**23.** ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන අවස්ථා

(1) බොස්ටන් තේ සාදය

(2) ජාතික සභාව පිහිටුවීම

(3) බැස්ටීලය බිඳ දැමීම

(4) භීම සමය

(5) අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලනය (.......)

**24.** අප්‍රිකාව සඳහා වූ පොරය

(1) අප්‍රිකානු මහද්වීපයේ බලය පිහිටුවීම සම්බන්ධයෙන් යුරෝපා රටවල් අතර ඇති වූ විරෝධතාව හා බල තරඟය, අප්‍රිකාව සඳහා වූ පොරය නමින් හැඳින් වේ.

(2) මිෂනාරීහු හා ගවේෂකයෝ අප්‍රිකානු මහද්වීපය යුරෝපයට විවෘත කළහ.

(3) බෙල්ජියමේ ලියෝපෝල්ඩ් රජු විසින් කොංගෝ නිදහස් රාජ්‍යය පිහිටුවන ලදී.

(4) ජර්මනිය විසින් ඊජිප්තුව යටත් කර ගන්නා ලදී.

(5) ඇල්ජීරියාව ප්‍රංශය යටතේ පැවතුණි. (.......)

**25.** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන ආයතන

(1) පොදු රාජ්‍ය මණ්ඩලය (2) මහ සභාව

(3) ආරක්ෂක මණ්ඩලය (4) මහලේකම් කාර්යාලය

(5) ජාත්‍යන්තර අධිකරණය (.......)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A), (B), (C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ....................................... **1** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ....................................... **2** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ....................................... **3** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ....................................... **4** ද,
ප්‍රතිචාර **එකක් හෝ දෙකකට වැඩි** සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ............... **5** ද වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක් හෝ දෙකකට වැඩි** සංඛ්‍යාවක් නිවැරදි ය. |

**26.** පහත දැක්වෙන කරුණු අතුරෙන් ජාතික රාජ්‍යයක ලක්ෂණ කවරේ ද?

(A) බලවත් වැඩවසම් රදළ පන්තිය

(B) රදළ ප්‍රභුවරුන් සතුව තිබූ පුද්ගලික හමුදා

(C) ශක්තිමත් මධ්‍යම ආණ්ඩුව

(D) නිශ්චිත දේශ සීමා (.......)

**27.** කාර්මික විප්ලවය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) කාර්මික විප්ලවය එංගලන්තයේ ආරම්භ විය.

(B) කාර්මික විප්ලවය විසින් කර්මාන්තශාලා ක්‍රමය ආරම්භ කරන ලදී.

(C) දහනව වන සියවසේ දී යුරෝපයේ බොහෝ රටවල ශීඝ්‍ර කාර්මික දියුණුවක් ඇති විය.

(D) කාර්මික විප්ලවය නව අධිරාජ්‍යවාදය ඇති වීමට මඟ පෑදී ය. (.......)

**28.** ජර්මනිය එක්සත් කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) ප්‍රශියාවේ නායකත්වයෙන් ජර්මනිය එක්සත් කරන ලදී.

(B) සොල්වරයින් තීරු බදු සංගමය ජර්මන් රාජ්‍ය අතර වෙළෙඳාමට තිබූ බාධක ඉවත් කළේ ය.

(C) ලුවී නැපෝලියන්ගේ ආශිර්වාදය යටතේ ජර්මනිය එක්සත් කරන ලදී.

(D) ගැරිබෝල්ඩි එක්සත් ජර්මනියේ ප්‍රථම චාන්සලර් තනතුරට පත් විය. (.......)

**29.** නිරවි යුද්ධය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) දෙවන ලෝක යුද්ධයෙන් පසු ධනවාදී හා සමාජවාදී බල කඳවුරු අතර පැවති දේශපාලන හා රාජ්‍ය තාන්ත්‍රික ගැටුම නිරවි යුද්ධය ලෙස හඳුන්වනු ලැබේ.

(B) ජෝශප් ස්ටාලින්ගේ ප්‍රතිපත්ති නිරවි යුද්ධය තුනී කිරීමට හේතු විය.

(C) සෝවියට් දේශයේ බිඳ වැටීමෙන් පසු නිරවි යුද්ධය අවසන් විය.

(D) නිරවි යුද්ධ සමයේ දී නැගෙනහිර හා බටහිර ජර්මනිය එක්සත් කරන ලදී. (.......)

**30.** පහත දැක්වෙන නායකයන් අතුරෙන් ඉන්දුනීසියාවේ ජනාධිපතිවරයා/ ජනාධිපතිවරු කවු ද?/ කවුරුන් ද?

(A) අවුං සාන් (B) සුකර්ණෝ (C) සුහර්තෝ (D) රාමෝන් මැග්සේසේ (.......)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**31.** ''අවසන් රාත්‍රී භෝජනය'' නම් චිත්‍රය සිතුවම් කළ ශ්‍රේෂ්ඨ කලාකරුවා කවුද?

(1) ජිඕටෝ (2) බොටිචෙලි

(3) ලෙනාඩෝ ඩා වින්චි (4) මයිකලාංජිලෝ

(5) ටිටියන් (.......)

**32.** එංගලන්තයේ ප්‍රථම අගමැති ලෙස සැලකෙන්නේ කවරෙක් ද?

(1) ඔලිවර් ක්‍රොම්වෙල් (2) රොබට් වෝල්පෝල්

(3) චාල්ස් ටවුන්ෂෙන්ඩ් (4) ෆ්‍රෙඩ්රික් නෝර්ත්

(5) විලියම් පිට් (.......)

**33.** පරිනාමවාදය පිළිබඳ න්‍යාය ඉදිරිපත් කළ විද්‍යාඥයා කවුද?

(1) චාල්ස් ඩාවින් (2) ලුවී පාස්චර්

(3) හර්බට් ස්පෙන්සර් (4) සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්

(5) ඇල්බට් අයින්ස්ටයින් (.......)

**34.** ''නොනවතින විප්ලවය'' නමැති සංකල්පය ඉදිරිපත් කළ බොල්ෂෙවික් නායකයා කවු ද?

(1) ප්ලෙකනොෆ් (2) වී.අයි. ලෙනින් (3) බුකරින්

(4) ජෝශප් ස්ටාලින් (5) ලියොන් ට්‍රොට්ස්කි (.......)

**35.** මහජන චීන සමූහාණ්ඩුවේ ප්‍රථම අගමැතිවරයා කවු ද?

(1) සූන් යත් සෙන් (2) චියැං කායි ෂෙක් (3) මාඕ සේතුං

(4) චෞ එන් ලායි (5) ලින් පියාඕ (.......)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** හා **5** යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

| | **පළමු වැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර, පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| | **පළමු වගන්තිය** | **දෙවන වගන්තිය** | |
|---|---|---|---|
| **36.** | ක්‍රි.ව. 1649 දී එංගලන්තයේ පළමුවන චාල්ස් රජතුමා ට මරණීය දඬුවම පමුණුවන ලදී. | තෝමස් හොබ්ස් විසින් ''ලෙවියතාන්'' නම් ග්‍රන්ථය රචනා කරන ලදී. | (.......) |
| **37.** | ප්‍රංශ රජුගේ ආධිපත්‍යය සම්බන්ධයෙන් පැවති සීමා ඉවත් කිරීමත්, ප්‍රංශය යුරෝපයේ බලවත් ම රාජ්‍යය බවට පත් කිරීමත් රිචලියුගේ ප්‍රධාන අරමුණ විය. | විප්ලවයෙන් පසු ලුවී නැපෝලියන් ප්‍රංශයේ බලයට පත්විය. | (.......) |
| **38.** | ක්‍රි.ව. 1868 මෙයිජි ප්‍රතිෂ්ඨාපනයෙන් ජපානයේ ටොකුගාවා රාජවංශය ස්ථාපිත කරන ලදී. | බැටිස්ටා නම් ඒකාධිපති පාලකයා නෙරපා දමා ක්‍රි.ව. 1959 දී ෆිදෙල් කස්ත්‍රෝ කියුබාවේ බලය අත්පත් කර ගත්තේ ය. | (.......) |
| **39.** | දෙවන ලෝක යුද්ධය ආරම්භය වීමට ආසන්න කාලය වනවිට ජාතීන්ගේ සංගමය අක්‍රීය සංවිධානයක් බවට පත්ව තිබුණි. | මැංචූරියානු අර්බුදය හා ඇබිසියානු අර්බුදය විසඳීමට අසමත් වූ ජාතීන්ගේ සංගමය, හිට්ලර් පෝලන්තය ආක්‍රමණය කළ විට ඊට මැදිහත් වීමට හෝ උත්සාහ නොකළේ ය. | (.......) |
| **40.** | මෝති ලාල් නේරු ඉන්දියාවේ පළමුවන ජනාධිපතිවරයා ලෙස පත්විය. | සුල්ෆිකාර් අලි භූතෝ බංග්ලාදේශයේ පළමුවන අගමැතිවරයා විය. | (.......) |

* *

# (25 C) නූතන ලෝක ඉතිහාසය

**(ක්‍රි.ව. 1500 සිට ක්‍රි.ව. 1989 දක්වා)**

**II පත්‍රය (II කොටස)**

**සැලකිය යුතුයි.**

* **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **එක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **තුනකට ද** පිළිතුරු සපයන්න.

(පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ලෝකයේ දළ සිතියමක්** සපයා ඇත.)

---

**A කොටස**

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **(i)** | රතු මුහුද | **(ii)** | නයිල් ගඟ | **(iii)** | පිරනීස් | **(iv)** | බර්ලින් |
| **(v)** | මොස්කව් | **(vi)** | පෘතුගාලය | **(vii)** | පැනමා ඇළ | **(viii)** | මලක්කා සමුද්‍ර සන්ධිය |
| **(ix)** | පිලිපීන දූපත් | **(x)** | නිව්යෝර්ක් | **(xi)** | කේප් ටවුන් | **(xii)** | කල්කටා |

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)

**B කොටස**

**2.** ''ක්‍රි.ව. 1453 දී කොන්ස්තිනෝපලයේ වැටීම නූතන ලෝක ඉතිහාසයේ සන්ධිස්ථානයක් සලකුණු කරයි.'' සාකච්ඡා කරන්න. (ලකුණු 16යි)

**3.** ''අමෙරිකානු නිදහස් සටන බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට එරෙහි ව ක්‍රියාත්මක වූ ප්‍රථම සාර්ථක නිදහස් අරගලය විය.''

**(i)** අමෙරිකානු නිදහස් සටනේ නායකයා නම් කරන්න. (ලකුණු 01යි)

**(ii)** උතුරු අමෙරිකාවේ පැවති ඉංග්‍රීසි ජනපද **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි)

**(iii)** අමෙරිකානු නිදහස් සටනට තුඩු දුන් ආර්ථික සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 04යි)

**(iv)** අමෙරිකානු නිදහස් සටනේ ප්‍රතිඵල හා බලපෑම් ඇසුරෙන් එහි වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 09යි)

**4.** පළමුවන ලෝක යුද්ධය ඇතිවීමට තුඩු දුන් හේතු පහත දැක්වෙන තේමා යටතේ සාකච්ඡා කරන්න.

**(i)** නව අධිරාජ්‍යවාදය

**(ii)** යුරෝපය බල කඳවුරු දෙකකට බෙදීම (ලකුණු 16යි)

**5.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

**(i)** එංගලන්තයේ පාර්ලිමේන්තු ක්‍රමයේ වර්ධනය

**(ii)** ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල

**(iii)** ඉතාලිය එක්සත් කිරීමේ ප්‍රධාන අවස්ථා

**(iv)** වී.අයි. ලෙනින් (එක් සටහනකට ලකුණු 08 බැගිනි)

## C කොටස

**6.** ''යුරෝපයේ ෆැසිස්ට්වාදයේ හා නට්සිවාදයේ නැඟීම දෙවන ලෝක යුද්ධය ඇති වීමට තුඩු දුන් ප්‍රධාන සාධකයක් වේ.''

**(i)** යුරෝපයේ ෆැසිස්ට්වාදය හා නට්සිවාදය නැඟී ආ රටවල් **දෙක** නම් කරන්න. (ලකුණු 02යි)

**(ii)** එම රටවල සිටි ෆැසිස්ට්වාදී හා නට්සිවාදී නායකයන් **දෙදෙනා** නම් කරන්න. (ලකුණු 02යි)

**(iii)** එම රටවල ෆැසිස්ට්වාදය සහ නට්සිවාදය නැඟී ඒමට තුඩු දුන් පොදු සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 04යි)

**(iv)** ෆැසිස්ට්වාදයේ සහ නට්සිවාදයේ නැඟීම දෙවන ලෝක යුද්ධය ඇති වීමට කෙතෙක් දුරට හේතු වී දැයි විමසන්න. (ලකුණු 08යි)

**7.** පහත සඳහන් තේමා ඇසුරෙන් චීන කොමියුනිස්ට් විප්ලවය පිළිබඳ විග්‍රහයක් කරන්න.

**(i)** මාඕ සේතුංගේ නායකත්වය

**(ii)** මහජන චීන සමූහාණ්ඩුව පිහිටුවීම (ලකුණු 16යි)

**8.** **(i)** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන අරමුණු විස්තර කරන්න. (ලකුණු 06යි)

**(ii)** ක්‍රි.ව. 1980 තෙක් එක්සත් ජාතීන්ගේ සංවිධානය එකී අරමුණු සාර්ථක කර ගැනීම සඳහා කෙතෙක් දුරට සමත් වී ඇද්දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 10යි)

**9.** පහත දැක්වෙන නායකයන් අතුරෙන් ඕනෑම **දෙදෙනෙකුගේ** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

**(i)** මහත්මා ගාන්ධි

**(ii)** ජෝශප් ස්ටාලින්

**(iii)** හෝ චි මිං

**(iv)** සුකර්ණෝ (එක් කෙටි සටහනකට ලකුණු 08 බැගිනි)

* * *

# (25 C) නූතන ලෝක ඉතිහාසය

**(ක්‍රි.ව. 1500 සිට ක්‍රි.ව. 1989 දක්වා)**

**II කොටස**

1.

